www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | චිත්‍ර කලාව | 3 ඒකකය |
|---|---|---|

කාලය : පැය 01

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. මුරගල නමින් හඳුන්වන්නේ කුමක්ද?
02. මුරගලේ විකාශනය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.
03. ශ්‍රී ලංකාවේ කලාත්මක අතින් උසස්ම මුරගල ඇති ස්ථනය නම් කරන්න.
04. පොළොන්නරු යුගයට අයත් ලංකාවේ උසස්ම මුරගල ඇති ස්ථානය නම් කරන්න.
05. කොරවක්ගල නමින් අර්ථ ගන්වන්නේ කුමක්ද?
06. කොරවක්ගල නිර්මාණය කර ඇති ආකාරය පිළිබඳව විවරණයක යෙදෙන්න.
07. කොරවක්ගලේ ඇති සිංහ රුව වෙනුවට විවිධ කාලවල ඊට ආදේශ වී ඇති අනෙකුත් රූප මොනවාද?
08. කොරවක්ගලේ විකාශනය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.
09. කලාත්මක අතින් උසස්ම කොරවක්ගල කුමක්ද? එය අයත් වන යුගය කුමක්ද?
10. පොළොන්නරු යුගයේ හා ගම්පොළ යුගයේ නිර්මිත කොරවක්ගල් ඇති ස්ථාන නම් කරන්න.
11. පියගැටවල අලංකාරය සඳහා යොදාගෙන ඇති කැටයම් වර්ග මොනවාද?
12. සමීප පෙළට සිටින වාමන රූප රාශියක් ඇති පිය ගැට පෙළ දක්නට ඇත්තේ කිනම් ස්ථානයකද?
13. පියගැට පෙළ නිර්මාණය කර ඇති මාධ්‍ය කුමක්ද?
14. විවිධ ලියවැල් මෝස්තරවලින් අලංකාර කර ඇති පියගැට පෙළ දැකිය හැක්කේ කුමන ස්ථානයේද?
15. අනුරාධපුර බිසෝ මාලිගයේ පියගැට පෙල අලංකාරය සඳහා යොදා ඇති මෝස්තර මොනවාද?

*සැකසුම: එම්.ටී.ජී. දිනූෂ උපසේන*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk